# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| තැ.පෙ.අංකය<br>த. பெ.இ<br>Po.Box No | 10120 | ෆැක්ස්<br>தொலைநகல<br>Fax | 011-2171635 |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 011-2887973<br>(HUNTING) | වෙබ්.ලිපිනය<br>இணையதளம்<br>Web Site | www.Police.lk |
| ඊ මේල්<br>மின்னஞ்சல்<br>E-mail | dir.media@police.gov.lk | | |


| | | | | | |
|---|---|---|---|---|---|
| මගේ අංකය<br>எனது இலக்கம்<br>My NO | 1535 /2023 | ඔබේ අංකය<br>உமது இலக்கம்<br>Your No | / 2023 | දිනය<br>திகதி<br>Date | 07/12/2023<br>පැය 0920 |

**මාධ්‍ය නිවේදනය**

**<u>පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු ජනමාධ්‍ය වෙත යොමු කිරීම.</u>**

**01. 2023.12.06 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරින් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 01 | 01 | 100 | - | යකඩ බැරල් 03<br>තඹ දඟර 03 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරු සහ දේපල අදාළ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**02. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන කඳවුර.**

2023.12.06 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත අතුරුගිරිය පොලිස් වසමේ කපුරුගොඩ අත්පන්දු ක්‍රීඩාපිටිය අසලදී වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 08 මිලිග්‍රෑම් 390 ක්, මුදල් රුපියල් 10,000/- ක්, උල් පිහි 01 ක් හා ජංගම දුරකථනයක් සන්තකයේ තබාගෙන සිටි** සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන අතුරුගිරිය පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 43 ක් වන පනාගොඩ, හෝමාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.**

මෙම සැකකරු මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු හා සංවිධානාත්මක අපරාධකරුවෙකු වන දැනට විදේශ රටක සැඟවී සිටින ජාගොඩගේ තනුජ සම්පත් නොහොත් හඳපාන්ගොඩ හඳයා යන අයගේ සමීපතමයෙකු බවට තොරතුරු අනාවරණය වී ඇත. අතුරුගිරිය පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**03. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකාරියක් අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන කඳවුර.**

2023.12.06 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මූලස්ථාන කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වැල්ලම්පිටිය පොලිස් වසමේ අංගොඩ ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය කිලෝග්‍රෑම් 01 ග්‍රෑම් 50 ක්, මුදල් රුපියල් 12,000/- ක්, විද්‍යුත් තරාදියක් හා ජංගම දුරකථනයක් සන්තකයේ තබාගෙන සිටි සැකකාරියක්** අත්අඩංගුවට ගෙන පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකාරිය වයස අවුරුදු 30 ක් වන හුනුපිටිය, වත්තල ප්‍රදේශයේ පදිංචිකාරියකි.**

මෙම සැකකාරිය මහා පරිමාණ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවෙකු හා සංවිධානාත්මක අපරාධකරුවෙකු වන මාතර කල්ප යන අයගේ මත්ද්‍රව්‍ය ජාවාරම මෙහෙය වූ අය බවට දැනට සිදු කරන ලද විමර්ශනයේදී අනාවරණය වී ඇත. පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුර.**

2023.12.06 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා මොරටුව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත මොරටුව පොලිස් වසමේ ලුනාව දුම්රියපොල අසලදී වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 04 මිලිග්‍රෑම් 52 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන මොරටුව පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 49 ක් වන ලුනාව, මොරටුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** මොරටුව පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුර.**

2023.12.06 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා හොරණ කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත හොරණ පොලිස් වසමේ බටුවිට ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 04 මිලිග්‍රෑම් 670 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන හොරණ පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 39 ක් වන මීමන, පොකුණුවිට ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** හොරණ පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**06. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කෑගල්ල කඳවුර.**

2023.12.06 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කෑගල්ල කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත වරකාපොල පොලිස් වසමේ තුල්හිරිය ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **කේරළ ගංජා ග්‍රෑම් 20 මිලිග්‍රෑම් 100 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන වරකාපොල පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 48 ක් වන මැටියගනේ, බෙලිගල ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** වරකාපොල පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

## 07. කේරළ ගංජා සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා අක්කරපත්තුව කඳවුර.

2023.12.06 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා අක්කරපත්තුව කඳවුරේ නිලධාරීන්ට ලද තොරතුරක් මත එරගම පොලිස් වසමේ කුලතාමන්වලි ප්‍රදේශයේදී වැටලීමක් සිදු කර **කේරළ ගංජා ග්‍රෑම් 17 මිලිග්‍රෑම් 50 ක් සන්තකයේ තබාගෙන සිටි සැකකරුවෙකු** අත්අඩංගුවට ගෙන එරගම පොලිස් ස්ථානය වෙත භාර දී ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 25 ක් වන එරගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකි.** එරගම පොලිසිය වැඩිදුර විමර්ශන සිදු කරනු ලබයි.

**මාධ්‍ය ප්‍රකාශක කාර්යාලය**
**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**